**හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී - 2016**

**-----------------------------------------------------------------**

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී හි (සමාගම) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය ") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2 මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**--------------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී හි (සමාගම) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**අවධාරණය කළ යුතු කරුණු**

**-----------------------------------------**

සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරන පිරිවැය රු.1,933,122,442 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් පිළිබඳ විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 12.3 ට මම අවධානය යොමු කරවමි. වර්තමානයේ සමාගමේ ප්‍රධාන ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර 2018 වර්ෂය වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන මෙම ප්‍රතිසංස්කරණ වැඩසටහන අවසන් වනවිට මෙම වත්කම් ප්‍රතිෂ්ඨාපනය හෝ නවීකරණය වී නව අගයන් නිරූපනය වනු ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු නොලැබේ.

**2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තාව**

**------------------------------------------------------------------------**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියෙහි අවශ්‍ය පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

අ. මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. - විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------------**

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර)**

**-------------------------------------------**

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 16: දේපල, පිරියත සහ උපකරණ**

රු.1,933,122,442 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කිරීමෙන් තොරව සමාගම විසින් මුදල් ප්‍රවාහ උත්පාදනය කිරීමට අඛණ්ඩව යොදාගෙන තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුලදී අපහරණය කරන ලද රු.4,238,000 ක් වූ වත්කම්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂය, ගිණුම් පොත්වලින් ලියා හැර නොතිබුණි.

**(ආ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 19 : විශ්‍රාම ප්‍රතිලාභ වගකීම**

ජනවිකාශන උපකල්පන සහ මූල්‍ය උපකල්පන යන උපකල්පන දෙකම සමාලෝචිත වර්ෂය තුළ වෙනස් කර තිබුණ ද එම වෙනස්කිරීමෙන් හටගන්නා ආයුගණක ප්‍රතිලාභ සහ අලාභ සමාගම විසින් හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 37 - වෙන්කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්**

නගර සභා ආඥා පනත අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (එස්එල්ටීඩීඒ) නියමිත පරිදි ලියාපදිංචි කර ඇති අවන්හල් / හෝටල් / අමුත්තන්ගේ නිවාස විසින් හෝටල් වෙළඳ බලපත්‍ර ගාස්තුව ලෙස පෙර වර්ෂයේ මුළු ආදායමෙන් සියයට 0.5 ක් කොළඹ නගර සභාවට (සීඑම්සී) ගෙවීමට වගකිව යුතු බව එස්එල්ටීඩීඒ තහවුරු කර තිබුණි. 2007 සිට එවැනි අනුකූල නොවීම සම්බන්ධයෙන් සීඑම්සී විසින් හෝටලයට එරෙහිව (නගරයේ සියලුම හෝටල් ඇතුළුව) උසාවියේ නඩුවක් ගොනුකර තිබුණි. මුළු ආදායමෙන් සියයට එකක් හෝ රු.50,000 ක් යන්නෙන් අඩු අගයකට සමාගම විසින් වෙන්කිරීම් සිදුකර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු. මිලියන 6.5 ක් විය. තීන්දුවේ අවසාන තීරණය අනුමාන කළ නොහැකි වුවද, 2007 සිට මුළු ආදායමෙන් සියයට 0.5 ක් වන පරිදි ආසන්න වශයෙන් වර්ෂ අවසාන වන විට තත්‍ය වටිනාකම රු. මිලියන 94 ක් බැවින් එය සිදුකරන ලද වෙන්කිරීමට වඩා රු. මිලියන 87.5 කින් ඉහළ අගයක් විය

**2.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

දින 150 ට වඩා හිඟව පැවති ණයගැතියන්ට අදාළව අපහායන දර්ශක පැවතියද, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් සහ ජනාධිපති මන්දිරයෙන් අයවිය යුතු රු.3,236,129 ක වටිනාකමට අදාළව වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.172,944,000 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවයක කාලපරිච්ඡේදය සඳහා රු.91,714,000 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,230,000 ක වර්ධනයක් දැක්වුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහළ කාමර සංඛ්‍යාවක් භාවිතයේ යෙදවීම සහ මංගල භෝජන ශාලාව සම්පූර්ණයෙන් භාවිතා කිරීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට හේතු වී තිබුණි.

සමාගමේ 2012 සිට 2016 දක්වා වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී, එම කාලපරිච්ඡේද තුළ අගය එකතු කිරීම උච්චාවචනය වී ඇති බව හෙළිදරව් විය. වැටුප්, බදු හා ක්ෂය (ලාභාංශවලට පෙර) අයකිරීමෙන් පසු 2015 සහ 2016 වර්ෂවල අගය එකතු කිරීම පිළිවෙලින් රු.999,741,000 ක් සහ රු.1,337,829,000 ක් වූයෙන් 2016 වර්ෂයේ දී සියයට 35 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 3.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය

**(අ) වැදගත් ගිණුම්කරණ අනුපාත**

2015 සහ 2016 වර්ෂවල සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2016 | 2015 |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය (%) | 82.65 | 82.60 |
| දළ ලාභ අධිකය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) % | 476.51 | 474.60 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 6.81 | 6.41 |
| බීම පිරිවැය ප්‍රතිශතය (%) | 0.16 | 0.16 |

| | | |
|---|---|---|
| බීම පිරිවැටුම් අනුපාතය (%) | 0.94 | 1.25 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය (වාර ගණන) | 0.001 | 0.18 |
| තොග පිරිවැටුම (වාර ගණන) | 10.38 | 10.44 |
| ආහාර තොග පිරිවැටුම (වාර ගණන) | 31.38 | 30.79 |
| ජංගම අනුපාතය | 1.18:1 | 2.37:1 |
| ක්ෂණික අනුපාතය | 1.12:1 | 1.17.1 |
| සැපයීම සඳහා තබාගෙන ඇති කාමරයක ආදායම (රු.) | 10.966 | 9,840 |
| කාමරයක සාමාන්‍ය රේටය (රු.) | 28.968 | 25.995 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ ආන්තිකය හා දළ ලාභ අධිකය පිළිවෙලින් සියයට 0.05 කින් සහ සියයට 1.91 කින් වැඩි වී තිබුණි. තවද, එම කාලපරිච්ඡේදයටම අදාළව කාලපරිච්ඡේදයේදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 0.4 කින් වර්ධනය වී තිබුණි.

**(ආ) කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

---

සමාගමේ ඉකුත් වර්ෂ පහ සඳහා කාරක ප්‍රාග්ධනය සහ ණය ගෙවීමේ හැකියා ආන්තිකයන් පහත දැක්වේ.

වටිනාකම "000 "

| විස්තර | 2016<br>රු. | 2015<br>රු. | 2014<br>රු. | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් | 1,016,007 | 1,667,899 | 1,688,655 | 2,155,725 | 2,223,136 |
| <u>අඩුකළා</u> | | | | | |
| ජංගම වගකීම් | 862,057 | 504,279 | 261,437 | 959,745 | 495,045 |
| **කාරක ප්‍රාග්ධනය** | **153,950** | **1,163,620** | **1,427,218** | **1,195,980** | **1,728,091** |
| ශුද්ධ වත්කම් | 13,772,897 | 13,636,951 | 13,620,032 | 13,437,306 | 10,897,528 |
| <u>අඩුකළා</u> | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 20,466,456 | 20,466,456 | 20,466,456 | 18,116,157 | 452,261 |
| **ණය ගෙවීමේ හැකියා ආන්තිකය** | **(6,693,559)** | **(6,829,505)** | **(6,846,425)** | **(4,678,851)** | **10,445,267** |

ඉකුත් වර්ෂ පහක සමාගමේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් තත්ත්වයන් විශ්ලේෂණයේදී, කාරක ප්‍රාග්ධනය සතුටුදායක මට්ටමක් පෙන්වමින් ධනාත්මක ණය ගෙවීමේ ආන්තිකයකින් 2012 සිට වර්ෂ පහ මුළුල්ලෙහිම පැවතුණි. කෙසේ වුවද එම කාලපරිච්ඡේදය සඳහාම ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනය සමග විශ්ලේෂණයේදී එය සෘණාත්මක ණය ගෙවීමේ ආන්තිකයක් 2013 සිට පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------------

මූලික ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 1,563 ක් සමඟ ලෝක ව්‍යාප්ත හිල්ටන් සන්නාම ප්‍රමිතියට අනුකූල වන පරිදි 2014 සිට කොළඹ හිල්ටන් හෝටලයේ නවීකරණයක් සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

**(අ)** නවීකරණ වැඩ සටහන අවසන් කිරීම සඳහා ඇති හදිසි තත්ත්වය සැලකිල්ලට ගෙන උපදේශකවරු තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම ද ඇතුළුව මුළු නවීකරණ වැඩ සටහනේ ප්‍රසම්පාදන කමිටුව ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කිරීම සඳහා සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරවීම සඳහා සමාගම විසින් 2012 මාර්තු 28 සහ 2012 පෙබරවාරි 21 දින මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනයේ ස්වභාවය සහ හදිසි තත්ත්වය සැලකිල්ලට ගෙන, මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් 2012 මාර්තු 29 දින කොන්ත්‍රාත් සහ මූල්‍ය කළමනාකරණයේ උපරිම කාර්යක්ෂමතාවය තහවුරු කරමින් ව්‍යාපෘති උපදේශකවරයෙක් තෝරා ගැනීමට සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අනුමැතිය දී තිබුණි. 2015 ජූනි 22 දිනැති සහ පීඊඩී/පීඑම්ඩී/හිල්ටන් අංකයෙන් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් උපදේශකවරුන් සහ කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදි ආයතනයට විශේෂි වූ ප්‍රසම්පාදන පටිපාටි පිළියෙල කරන ලෙස පසුව උපදෙස් දී තිබුණ ද, එවැනි පිළියෙල කිරීමකින් තොරව, නවීකරණ වැඩ සටහන සඳහා සමාගම විසින් උපදේශකවරුන් සහ කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන තිබුණි.

**(ආ)** නවීකරණ වැඩ සටහනේ අදියර I හි වැඩ සඳහා වූ මූලික ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 1,563 ක් වුවද, මූලික ඇස්තමේන්තුවට වඩා රු. මිලියන 306 ක ඉහළ අගයක් වූ රු. මිලියන 1,869 ට තෝරාගත් ලංසු තබන්නෙකුට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කෙසේවුවද, වැඩ සම්පූර්ණ කිරීම වෙනුවෙන් අමතර වැඩ සඳහා රු. මිලියන 351 ක් සහ විචලනයන් සඳහා රු. මිලියන 282 ක් තවදුරටත් අනුමත කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට තවත් බිලක් ගෙවීමට ඉතිරිව තිබියදි කොන්ත්‍රාත්කරුට රු.මිලියන 1,908 ක් ගෙවා තිබුණි.

**(ඇ)** කොන්ත්‍රාත්කරු සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව අදියර I ඒ සහ I බී හි මූලික වැඩ අවසන් කිරීමේ දිනය 2015 මැයි 22 වුවද, ආරම්භයේදි එකඟ වූ දිනයෙන් සමස්ත අදියර නිම කිරීම මාස 26 ක ප්‍රමාදයකින් යුක්තව, සත්‍ය වශයෙන් අදියර I ඒ සහ I බී පිළිවෙලින් 2016 ජූලි 15 සහ 2017 අගෝස්තු 17 දින අවසන් කර තිබුණි.

**(ඈ)** 2012 සිට සමාගම ව්‍යාපෘති සහ පිරිවැය කළමනාකරණය සඳහා උපදේශකවරුන් කිහිප දෙනෙකුගේ සේවාව ලබාගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ සමාගම් තුනකට රු. මිලියන 737 ක් ගෙවා තිබුණි. බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලඟාකර ගැනීමට අසමත්වීම හේතුවෙන් උපදේශකවරුන් ලෙස ක්‍රියාකළ සමාගම් දෙකක වැඩ සමාගම විසින් අවසන්කර තිබුණි. 2012 මූලික වැඩ ආරම්භ කිරීමෙන් වසර 5 කට පසු පවා, කාමර සහ කාමර කොරිඩෝ නවීකරණය ඇතුළත් අදියර II තවදුරටත් වැඩ සටහන යටතේ ආරම්භ කළ යුතුව පැවතුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** **සංයුක්ත සැලැස්ම**

සමාගම සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**6.** **පද්ධති සහ පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය නොකිරීම |
| (ආ) කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත් අවසන් කිරීමේදී කාල කළමනාකරණය පිළිනොපැදීම |